# 2.60 යටත් විජිත පාලන සමයේ දී ක්‍රීඩා ව්‍යාප්තිය සඳහා වූ බලපෑම

පී.ඩී.විමුක්ති චාරිකා වික්‍රමරත්න
ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව

## ABSTRACT

පෞරාණික ශිෂ්ඨාචාරයන් හි මෙන්ම ශ්‍රී ලංකාවේද ක්‍රීඩා හා කෙළි සෙල්ලම් පැවති බව මානව වංශ කතාවේ විකාශනය පිළිබඳ කරුණු හැදෑරීමේදී සනාථ වන්නකි. 1505 සිට 1948 නිදහස ලැබෙන තුරු පෘතුගීසි ලන්දේසි හා ඉංග්‍රීසි පාලන සමයේදී අනිකුත් ක්ෂේත්‍රයන් මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයේද සැලකිය යුතු වෙනසක් සිදුවූ බව අතීතය දෙස ආපසු හැරී බැලීමේදී පැහැදිලි වේ .මෙම වකවානුවේදී පෘතුගීසි ආක්‍රමණයන් සමගම ජනයා තුළ රණකාමී හැඟීම් ඉස්මතු විය. රණකාමීන් දිරි ගැන්වීමටත් ඔවුන්ගේ සංඛ්‍යාත්මක වර්ධනය සඳහාත් රාජ්‍ය තිළිණයන් හා සම්මාන රණකාමීන්ට පිරිනැමීය . මේ ආකාරයට ක්‍රීඩාවේ ව්‍යාප්තිය යුගයෙන් යුගයට ඇති වූ අතර යටත් විජිත පාලන සමය ක්‍රීඩා ව්‍යාප්තිය සඳහා කෙතරම් බලපෑවේ ද යන්න විමසා බැලීම වැදගත් වේ

මෙම අධ්‍යයනයට ක්‍රීඩාව හා සම්බන්ධ පොත පතින් ද්විතීය දත්ත රැස්කරනු ලැබීය. ඒ අනුව යටත් විජිත පාලන සමයේ දී ශ්‍රී ලංකාව තුළ ක්‍රීඩාව ව්‍යාප්ත වී ඇති බව පැහැදිලි වේ. යටත් විජිත පාලකයන් ලංකාව පාලනය කිරීමේදී ඔවුන්ගේ විශ්‍රාන්ති අවශ්‍යතාව සඳහාත් සන්නිවේදන කටයුතු පවත්වා ගැනීම සඳහාත් ලංකාව තුළ තම මව් රටෙ හි පැවැත් වූ ක්‍රීඩා හඳුන්වා දී ඇත. මෙය ශ්‍රී ලංකාව තුළ නව ක්‍රීඩා ඇති වීමටත් ඒවා ව්‍යාප්ත වීමටත් හේතු වී ඇත.

**මුඛ්‍ය පද :** යටත්විජිත පාලනය, ක්‍රීඩා විශ්‍රාන්තිය , ක්‍රීඩා ව්‍යාප්තිය